### මුල් ඉදිරීම.

පළමුවර අස්වැන්න ලබා, අවුරුද්දක් ගතවීමට පෙර, මුල් උදුරා, සීසෑම සම්පූර්ණ විය යුතු යි. මෙය මෙසේ නොවේ නම්, වල් පැළෑටි වඳ කිරීම බරපතළ ප්‍රශ්නයක් විය හැකි ය. පස තෙමී තිබෙන විට මුල් ඉදිරීම ආරම්භ නො කළොත් වියදම අධික වේ. අප්‍රේල්, මැයි සහ ඔක්තෝම්බර සිට ජනවාරි දක්වා කාලය ද මේ සඳහා යෝග්‍ය වේ. කුලීකරුවන් හිඟවීමක් ඇතිවුවහොත්, මුල් ඉදිරීමේ කටයුතුවලින් කොටසක් ප්‍රථම කාලයේදී ද, ඉතිරි කොටස ඊළඟ කාලයේදී ද කළ හැකි ය. මුල් ඉදිරීමට පෙර ද සුදුසු ධාන්‍ය වර්ගයක් වැපිරීම නුවණට හුරු ය. එයින්, පස වැසී තිබීමත්, සුළු වශයෙන් වත් ආදායමක් ලැබීමත් සිදු වේ. මුල් ඉදිරීමේදී මුදුන් මුලත් සමග අතිකුත් මුල් අඩියක් පමණවත් යටට උදුරා දැමිය යුතු යි. විහිදෙන මුල් ඉතා ප්‍රවේසමින් ඉවත් නො කළොත්, සීසෑමට බාධා පැමිණ සමහරවිට නගුල් ද තුවාල වේ. මුල් ඉදිරීම සඳහා සාමාන්‍යයෙන් උදළු, පොරෝ, අලවංගු සහ කුළු ගෙඩි ද පාවිච්චි කරනු ලැබේ. මේ සඳහා සමහරවිට මුල් උදුරන යන්ත්‍රයක් පාවිච්චි කරනු ලබන නමුත්, ඉතා කුඩා මුල් ද, ඉතා විශාල මුල් ද මේ යන්ත්‍රයෙන් ඉදිරීම අපහසු ය. බොහෝවිට, මුල අවට හාරා, පැත්තට විහිදෙන කුඩා මුල් කපා, ප්‍රධාන මුල උදුරා දැමීම සඳහා යන්ත්‍රය ක්‍රියාවේ යොදනු ලැබේ. ප්‍රධාන මුල මේ අන්දමට අස්කිරීමෙන් පසු, කුඩා මුල් සොයා, ඒවා ඉවත් කළ යුතු යි. මේ යන්ත්‍රය පාවිච්චි කිරීමෙන් වියදම ඉතා අඩු වේ. වියලි කලාපයේ ඉඩම් දියුණු කිරීමේදී විසඳීමට තිබෙන ඉතා බැරෑරුම් ප්‍රශ්නය නම් මුල් ඉදිරීම යි. මේ සඳහා සුදුසු උපකරණයක් පිට රටින් වත් ගෙන්වීමෙන් යහපතක් සිදු වන්නේය. මුල් ඉදිරීමෙන් පසු, මුල් සියල්ලම ගොඩ ගසා, පුළුස්සනු ලැබේ. මුල් ඉදිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් කුහර සෑදේ. සමහරවිට මේ කුහර විශාල වේ. පස්වලින් මේ කුහර පුරවා, මට්ටම් කරනු ලැබේ. දැන් ඉඩම සීසෑම සඳහා පිළියෙළ වී තිබේ.

---

## ඌව පළාතේ උඩුකිඳ කොට්ඨාශයේ පිට රට එළවළු වගා කිරීම දියුණු වූ පිළිවෙළ.

## Progress of Cultivation of Exotic Vegetables in Udukinda Division, Province of Uva.

[බී. ඒ. (කේම්බ්‍රිජ්), ඒ. අයි. සී. ටී. ඒ. (ට්‍රිනිඩෑඩ්) උපාධිධාරී,
නැගෙනහිර කොට්ඨාශය භාර, ප්‍රාදේශික කෘෂිකර්ම නිලධාරි තැන්පත්
එච්. ඒ. පීරිස් මහතා විසිනි.]

පිට රට එළවළු වර්ග උඩුකිඳ කොට්ඨාශයෙහි වගා කිරීම ඉතා විශාලලෙස පටන්ගෙන තිබේ. විශේෂයෙන්, බන්ඩාරවෙල, ඇටම්පිටිය, වැලිමඩ, ගුරුතලාව, පාලුගම සහ අඹේවෙල යන ස්ථාන මේ ව්‍යාපාරය ගැන ප්‍රසිද්ධ ය. විකිණීම සඳහා මේ එළවළු වර්ග දැනට කොටුවල වගා කරනු ලැබේ. හදිසි තත්ත්වය එළඹීමට පෙර මෙකී කොටුවලින් ලැබුණු පලදාව බන්ඩාරවෙල, දියතලාව, වැලිමඩ කොළඹ සහ නුවරඑළිය යන වෙළෙඳාම් පොලවලදී අහම්බෙන් විකුණන ලදී. මේ එළවළු

තැනින් තැන ගෙනයාම ත්, බෙදාහැරීම ත් නිසිලෙස පිළියෙළ නො විය. ද්‍රව්‍ය නිපදවන තැනැත්තා සහ පාවිච්චි කරන තැනැත්තා අතර මැදිහත්වෙන අයට සහ වෙළෙඳුම්පලවලට බඩු සපයන්නන්ටත් තමන්ගේ එළවළු විකුණා, ඔවුන්ගෙන් ලැබෙන යම් මුදලක් භාරගෙන, එයින් සතුටුවීමට, එළවළු වගාකරන්නෝ පුරුදුවී සිටිය හ. හදිසි තත්ත්වය එළඹීමට පෙර ද, එළවළු වගී ගෙනයාම අපහසු දෙයක් විය. ඉතා කඩිනමට ත් පහසුවෙනු ත් බඩු ගෙන යා හැකි බස් රථවල බඩු විශාල තොග ගණන් භාර නො ගන්නා ලදී. කරුණු මෙසේ හෙයින්, කරත්තවලින් හෝ මිනිසුන් ලවා හෝ එළවළු බොහෝ දුර ගෙනයන්නට සිදු විය. මෙය ප්‍රමාද වූ ත්, වෙහෙස විය යුතු වූ ත් ක්‍රමයක් හෙයින් වඩා කල් නො පවතින ද්‍රව්‍යයක් වූ එළවළුවලට නු සුදුසු විය. එළවළුවල මිල ද අඩු වූ හෙයින් වෙළෙඳාමෙන් ලාභයක් නැති විය. එළවළු අලෙවි කිරීම සඳහා නියම අන්දමට සකස් වූ වැඩ පිළිවෙළක් නො තිබුණි. ඉහත සඳහන් කරුණු හේතුකොටගෙන, වැදගත් ගොවිකම් ව්‍යාපාරයක් වූ එළවළු වගා කිරීම නිසි අන්දමට දියුණු වීමට බාධා ඇති විය.

එළවළු වැවෙන ප්‍රධාන ස්ථානය වූ පාලුගම, සමූපකාර වෙළඳ සමිතියක් පිහිටුවන ලදින්, එළවළු අලෙවි කිරීම සඳහා විධිවත් වැඩ පිළිවෙළක් ආරම්භ විය. ආරම්භයේ සිටම, ඊට සම්බන්ධ වූ ගොවීන්ට මුහුණ පෑමට තිබුණු අපහසුකම්, මගහරවන ලදී. දැනට, ගොවීන් විශාල සංඛ්‍යාවක් මෙම සමිතියේ සාමාජිකයින් වී තිබේ. ඔවුන්ගේ එළවළු අධික මිලට විකුණා ගැනීමට සමිතියෙන් උදව් ලැබේ. පිට රට එළවළු වගී වැවීම ගැන පමණක් සලකා බලනවිට, දැනට පවතින හදිසි තත්ත්වය මහාජනයාට අමිශ්‍රිත යහපතක් වී තිබේ. විශෙෂයෙන්ම මෙකී වෙළෙඳ සමිතියේ සාමාජිකයින්ට එය සෙතකි. ඉහත සඳහන් හැම ලොකු වෙළෙඳම් පලකම, මෙරට එළවළු, බලාපොරොත්තු තරමටත් වඩා වැඩියෙන් වුවමනා වෙයි. ගොවීන් විසින් නිපදවන ප්‍රමාණයට වඩා එළවළු තොගයක් වෙළෙඳාම පිණිස වුවමනා හෙයින්, ඒවායේ මිල ඉතා ඉහළ නැග තිබේ. ටික කලකට පෙර එළවළු වගා කිරීමෙන් සවල්ප ලාභ ලබාගත් වැවිලිකරුවෝ දැනට ඒ මගින් විශාල ප්‍රයෝජන ලබත්. එළවළු ගෙනයාමේදී මෙකී වෙළෙඳ සමිතිය විසින් ප්‍රයෝජන ගැනීම පිණිස මහජනාරක්ෂක කොමසාරිස් තුමා විසින් ලොරියක් පිළියෙළකර දී තිබේ. එළවළු වගාකරන ප්‍රධාන වාරයේදී, එළවළු ගෙනයාම පිණිස ලොරි දෙකක් බලයෙන් යොදන ලදී. ඉන් එකක් දින පතාම එළවළු රැගෙන කොළඹට ගියේ ය. වෙළෙඳ සමිතිය පිහිටුවා, ඒ අතර ව්‍යාපාරය විධිවත් ලෙස සකස් වී මෙන් ද, ඉක්මනින් බඩු ගෙන යාමෙන් ද යනාදී ප්‍රයෝජන හේතුකොට ගෙන එළවළු වගා කරන්නන්ට යහපතක් සිදු වී තිබේ.

වඩා හොඳ එළවළු වගී නිපදවීමට, අනුබල දීමක් වශයෙන් ද, සාමාන්‍ය යෙන් එළවළු වැවීම දියුණු කිරීමට ද, වර්ධනය කරන ලද වැවිලි ක්‍රම පිළිබඳ දැනීමක් වැවිලිකරුවන්ට ඇතිකර දීමට ද, සමූපකාර සමිතිවල සාමාජිකයින් අතර පිට රටින් ගෙන්වන ලද එළවළු ඇට නොමිලේ බෙදා දීමේ වැඩ පිළිවෙළක් වර්ෂ 1941 දී ආරම්භ කරන ලදී. මෙයින් පසු, පහත සඳහන් අන්දමට එළවළු ඇට බෙදා දෙන ලදී. වර්ෂ 1941 දී බෙදා දෙන ලද එළවළු ඇට සංඛ්‍යාව මෙසේ ය :—

| | | | | | |
|---|---|---|---|---|---|
| බීට්රූට් | රාත්තල් | 118 | නෝල්කෝල් | රාත්තල් | 14 |
| කැරට්ස් | ,, | 60 | තක්කාලි | ,, | 16 |
| රාබු | ,, | 50 | ලෙටූස් | ,, | 6 |
| ගෝවා | ,, | 40 | | | |

ඉන්දියාවෙන් ගෙන්වන ලද එළවළු ඇට පැකට් 3,248ක් සමූපාකාර සමිති 28කට ඇතුළත් වූ වැවිලිකරුවන් 619 දෙනෙකු අතර බෙදා දෙන ලදී. මේ වැඩ පිළිවෙළින් ලැබුණු ප්‍රතිඵල සතුටුදායක වී මෙන් එළවළු වවන්නන්ට මහත් අනුබලයක් ලැබිණ. පාලුගම වෙළෙඳ සමිතියේ කටයුතු සාර්ථකලෙස ඉටුවන අතර, සමිතිය කෙරෙහි එළවළු වවන්නන්ගේ විශ්වාසය ක්‍රමයෙන් දියුණු විය. සාමාජිකයින්ගේ යහපත සඳහා සිල්ලර බඩු ගබඩාවක් ද විවෘත කරන ලදී. එළවළු වගාකිරීම වර්ෂ 1942කෝ මාස් කාලයේදී ද දෙ වැනි වර්ෂයටත් කරගෙන යන ලදී. එළවළු ඇට ගෙන්වන ලද්දේ දකුණු අප්‍රිකාවෙන් හා ඉන්දියාවෙන් ය. නොමිලේ ඇට බෙදා දීම වැඩි දියුණු කරන ලදුව, අවුන්ස ¼ සිට 3 දක්වා බර ඇති එළවළු ඇට පැකට් ගණනක්ම සමූපාකාර සමිති 64කට ඇතුළත් වූ සාමාජිකයින් 1337 දෙනෙකු අතර බෙදා හරින ලදී. පළමු වර්ෂයේදී ට වඩා, සමිති 36කට දා වැවිලිකරුවන් 718 දෙනෙකුට ද දෙ වැනි වර්ෂයේදී එළවළු ඇට ලැබිණ. වර්ෂ 1942-43 මාස් මෝසමේදී එළවළු ඇට බෙදා හරින ලද පිළිවෙළ මෙසේ ය :—

| | | | | | |
|---|---|---|---|---|---|
| කැරට් | රාත්තල් | 210 | රාබු | රාත්තල් | 50 |
| සෙලරි | ,, | 15 | බීට්රූට් | ,, | 10 |
| තක්කාලි | ,, | 50 | ගෝවා | ,, | 10 |
| කෝලිෆ්ලවර් | ,, | 50 | ලෙටූස් | ,, | 10 |

මුළු ගණන රාත්තල් 405.

දකුණු අප්‍රිකාවෙන් එළවළු ඇට ලබාගැනීමට නුපුළුවන් වූ හෙයින් වර්ෂ 1943 දී ඉන්දියාවෙන් ඇට තොගයක් ගෙන්වා ගන්නා ලදී. මේ වර්ෂයේ මාස් කාලයේදී වගාකිරීම පිණිස, සමූපාකාර සමිති 60කට අයත් සාමාජිකයින් 1337 දෙනෙකුට එළවළු ඇට සපයා දෙන ලදී. එළවළු ඇට බෙදා හැරීම පහත සඳහන් පිළිවෙළට දෙවාරයකදී සිදු විය :—

| ඇට වර්ගය | මහ 1943 | | යල 1944 | |
|---|---|---|---|---|
| බීට් රූට් | රාත්තල් | 122 | රාත්තල් | 27 |
| ගෝවා | ,, | 63 | ,, | 17 |
| නෝල්කෝල් | ,, | 43 | ,, | 71 |
| ලීක්ස් | ,, | 8 | ,, | 1 |
| ලෙටූස් | ,, | 8 | ,, | 1 |
| සෙලරි | ,, | 9 | | — |

වර්ෂ 1944රේ එළවළු වගාකරන කාලයේදී නොමිලේ ඇට බෙදා දීමක් සිදු නො විය. ඒ වෙනුවට, ආණ්ඩුව විසින් එළවළු ඇට සපයා දුන් ලියා පදිංචි කරන ලද වෙළෙන්දන් ගෙන් පාලන මිලට තමන්ට වුවමනා එළවළු ඇට ලබා ගන්නා ලෙස වැවිලිකරුවන්ට දන්වන ලදී.

වර්ණනය කරන ලද ක්‍රම අනුව පිටරට එළවළු වගා කිරීමට අනුබල දීමක් වශයෙන්, වර්ෂ 1943 දී තරඟයක් පැවැත්විණ. එළවළු වගාකරන්නෝ මේ පිළිබඳ සෑහෙන පමණ සිත් යොමු කළහ. තරඟයේ ප්‍රධාන පරමාර්ථය වූයේ, මිශ්‍ර පොහොර සෑදීමට එළවළු වගාකරන්නන් උනන්දු කරවා, එය ඔවුන් ගේ කොටුවලට යෙදවීම යි. මේ සිරිත උඩුකිඳ දිස්ත්‍රික්කයේ සෑහෙන පමණ පතළ වී තැත.

පාලුගම පළාතේ පහසුවෙන් ඇට ලබාගත හැකි රාබු, ලෙටුස්, තක්කාලි, සෙලරි සහ කැරට් යනාදී එළවළු වර්ග වලින් තමන්ට වුවමනා පමණ ඇට නිපදවා ගන්නාලෙස, වැවිලිකරුවන්ට අනු බල දෙන ලදී. එළවළු ඇට ආණ්ඩුව විසින් මිලයට ගැනීමේ ක්‍රමයක් ද ආරම්භ විය. එම පළාතේ ම නිපදවන ලද පහත දැක්වෙන එළවළු ඇට තොගය වැවිලිකරුවන්ගෙන් මිලයට ගන්නා ලදී :—

තක්කාලි රාත්තල් 15; රාබු රාත්තල් 5; ලෙටුස් රාත්තල් 5.

---

## වී ගොවිතැන.
## Paddy Cultivation.

ලක්වැසියන්ගේ ප්‍රධාන ආහාරය සහල් ය. එහෙත් ඔවුන්ට අවුරුදු පතා වුවමනා සහල් ප්‍රමාණයෙන් මෙ රටෙහිම නිපදවනු ලබන්නේ තුනෙන් කොටසක් පමණකි. ඉතිරි තුනෙන් දෙකෙන් කොටස, පවතින වෙළෙඳ මිල අනුව, රුපියල් දශ ලක්ෂ 50 සිට 100 දක්වා මිලකට, දැනට පවතින හදිසි තත්ත්වය එළඹීමට පෙර පිට රටින් අවුරුදු පතා ගෙන්වන ලද්දේය. ජල සම්පාදනය කිරීමෙන් මෑතකදී අස්වද්දන ලද වැඩි අක්කර ගණනින් ලබාගත් අස්වැන්න ජනගහනයේ වැඩිවීමත් සමගම වැඩිවී තිබේ යයි සිතීමට ඉඩ තිබේ. එබැවින් සහල් පිළිබඳ තත්ත්වය වෙනස් වී නැතැයි කිය හැකි ය.

ලංකාවේ ඒ ඒ ප්‍රදේශවලින් ලැබෙන අස්වැන්න අඩු බව පිළිගත යුතු කරුණකි; එහෙත්, දිවයිනේ නොයෙක් පළාත්වල දෙපාර්තමේන්තුව මගින් පිහිටුවන ලද ආදර්ශ වී ගොවිපළවලත්, වී ගොවිතැනෙහි තත්ත්වය දියුණු කිරීම සඳහා ආරම්භ කරන ලද තරඟවලට සහභාගිවී තිබෙන පෞද්ගලික කුඹුරුවලත් ලැබී තිබෙන ප්‍රතිඵල අනුව කල්පනා කරන විට, සෑහෙන පමණකට අස්වැන්න වැඩි කළ හැකි බව පැහැදිලි වෙයි.

අතීතයේ සිද්ධීන් සහ දැනට ඇතිවී තිබෙන හදිසි තත්ත්වයත් සලකා බලන විට, අපේ ප්‍රධාන ආහාරය ලබා ගැනීම පිණිස විදෙශික වෙළෙඳ පලවල් කෙරෙහි බලාපොරොත්තුව සිටීමේ නුසුදුසු කම ගැන විශෙෂ වශයෙන් කරුණු කීම කිසි සේත් අවශ්‍ය නොවේ. අනාගතයේදී යුද්ධ ඇති නො වන්නේය යි කිය නො හැක. එබැවින් මෙරට වී ගොවිතැන සිර වූ ත්, අාර්ථික වූ ත් පදනමක පිහිටුවීම සඳහා හැම ප්‍රයත්නයක් ම දැරිය යුතු යි. මේ හේතුවෙන් ලංකාව හැකි පමණ සවයං පොෂිත වී, ජනගහනයෙන් විශාල කොටසකට රක්ෂාවල් ලැබී,